# කාර්‍ය මණ්ඩල පුවත්

අග්නි දිග ආසියාවේ මහ බැංකු අධිපති වරුන්ගේ සමුළුවට සහභාගී වීම සඳහා, අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා 1970 ජනවාරි 12 වැනි දින ලංකාවෙන් තායිලන්තය බලා පිටත්ව, 1970 ජනවාරි 19 වැනි දින ආපසු පැමිණියේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලංකාවේ විකල්ප අධිපති වශයෙන් ක්‍රියා කරන, මහ බැංකුවේ අධිපතිවරයා, කෝපන්හේගන්හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර බැංකුවේ වාර්ෂික රැස්වීමේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර බැංකුවේ ලංකාවේ අධිපති වරයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු මුදල් අමාත්‍ය ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා සමග එක්විය. ඔහු 1970 සැප්තැම්බර් 15 වැනි දින ලංකාවෙන් නික්ම 1970 සැප්තැම්බර් 30 වැනි දින ආපසු පැමිණියේය.

අධිපතිවරයා සේවයට නොපැමිණි කාලය තුල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති එස්. ඊ. පී. ජැන්ස් මහතා, මුදල් නීති පනතේ 24 වෙනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි තැන වශයෙන් සේවය කළේය.

මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් එම්. රාජේන්ද්‍ර මහතා අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ හා ප්‍රතිසංස්කරන හා සංවර්ධන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර බැංකුවේ රැස්වීමට සහභාගී වීම සඳහා ලංකාවෙන් බැහැරව සිටි කාලය තුල ඒ මහතා වෙනුවෙන් වැඩ බැලූ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සී. ඒ. කුරේ මහතා මුදල් මණ්ඩලයේ නිල සමාජිකයා වශයෙන් ක්‍රියා කළේය.

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් රජයේ සේවයේ යෙදී සිටි ආචාර්‍ය ගාමණී කොරයා මහතා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වශයෙන් 1970 ජූනි මස 11 වැනි දින යළි වැඩ බාර ගන්නා ලදී. නිව්යෝර්ක්හි වෙළඳම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි නිලයක් භාර ගැනීම සඳහා 1970 ඔක්තෝබර් මස ඔහු සේවයෙන් මුදා හරින ලද අතර, 1970 දෙසැම්බර් 14 දින සිට ඒ මහතා යළි මහ බැංකුවේ වැඩ භාර ගන්නා ලදී.

අභ්‍යන්තර විගණක, ඕ. බී. ගුණවර්ධන මහතා 1970 අප්‍රේල් 25 වැනි දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී. ඕ. බී. ගුණවර්ධන මහතා විශ්‍රාම ගැනීමට පෙර 1970 ජනවාරි 25 වැනි දින සිට නිවාඩු ගිය කාලය තුළදී අභ්‍යන්තර විගණක වශයෙන් වැඩ බැලීමට ලේකම් ඒ. සී. පී. ගුණසේකර මහතා පත් කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් අධිකාරි එච්. එල්. ඩී. සෙල්වරත්නම් මහතා 1970 ජූලි මස 1 වැනි දින සිට අභ්‍යන්තර විගණක වශයෙන් පත්ෘකරන ලදී.

ආයතන අධ්‍යක්ෂ එල්. ඩබ්ලිව්. ඒ. වීරසේකර මහතා රාජ්‍ය ණය අධිකාරි වශයෙන් 1970 ජූලි මස 1 වැනි දින සිට පත් කරන ලදී.

විනිමය පාලක සී. එච්. ප්‍රනාන්දු මහතා සේවක අර්ථසාධක අරමුදල් අධිකාරි වශයෙන් 1970 ජූලි මස 1 වැනි දින සිට පත් කරන ලදී.

රාජ්‍ය ණය අධිකාරි පී. එච්. සිරිවර්ධන මහතා උපදේශකයෙකු වශයෙන් 1970 ජූලි මස 1 වැනි දින සිට පත් කරන ලදී.

ක්‍රම සම්පාදන හා රැකී රක්ෂා අමාත්‍යාංශයට මුදා හරින ලද එම්. එම්. සෙනවිරත්න මහතා 1970 ජූලි මස 1 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්‍ය ඩබ්ලිව්. රාසපුත්‍රම් මහතා, බැංකොක්හි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රම සැලසුම් හා සංවිධාන අංශයේ පොදු ආර්ථික සැලසුම් විශේෂඥයෙකු වශයෙන් පත්වීමක් ලැබ ගැනීම සඳහා වසරකට සේවයෙන් මුදා හරින ලදී.

ඔහු බැහැරව සිටින කාලයේදී නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ එච්. එන්. එස්. කරුණාතිලක මහතා වැඩ බලන ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් 1970 ඔක්තෝබර් 21 වැනි දින සිට පත්කරන ලදී.

නියෝජ්‍ය ලේකම්, ඊ. එරමුදුගොල්ල මහතා 1970 ජූලි මස 1 වැනි දින සිට වැඩබලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විනිමය පාලක කේ. කනගසභාපති මහතා වැඩ බලන විනිමය පාලක වශයෙන් 1970 ජූලි මස 1 වැනි දින සිට පත් කරන ලදී.

බැංකොක්හි, ආසියාව හා ඈත පෙරදිග ආර්ථික කොමිසමේ, පර්යේෂණ හා සැලසුම් අංශයේ ප්‍රාදේශීය සැලසුම් උපදේශකව සිටි ආචාර්ය එස්. බී. ද සිල්වා මහතා 1970 අගෝස්තු මස 10 වැනි දින සිට කර්මාන්ත හා විද්‍යාත්මක පර්යේෂණ අමාත්‍යාංශයේ ආර්ථික උපදේශක වශයෙන් රාජකාරි කටයුතු භාර ගන්නා ලදී.

ක්‍රම සම්පාදන හා රැකී රක්ෂා අමාත්‍යාංශයට මුද හරිනු ලැබ සිටි, ඩී. ආර්. සිරිවර්ධන මහතා 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට යළි මහ බැංකු සේවයට ඇතුලත් විය.

අන්තර් ජාතික මූල්‍ය අරමුදලෙහි සේවයේ යෙදී සිටි එම්. ස්වාමිනාදන් මහතා 1970 පෙබරවාරි මස 16 වැනි දින සිට බැංකු සේවයෙන් ඉල්ලා අස් විය.

බී. බී. ඩී. ඇම් පෙරේරා මහතා සවුදි අරාබියාවේ ජාතික ගිණුම් හා ආර්ථික සංඛ්‍යා ලේඛන පිළිබඳ උපදේශක වශයෙන් එක්සත් ජාතීන්ගේ පත්වීමක් භාර ගැනීම සඳහා 1970 ජූලි 4 වැනි දින සිට වසරක කාලයකට සේවයෙන් මුද හරින ලදී.

බැංකොක්හි ආසියාව හා ඈත පෙරදිග ආර්ථික කොමිසමේ සේවයේ යෙදී සිටි සී. ඒ. බී. එන්. ජයරාජා මහතා 1970 දෙසැම්බර් මස 28 වැනි දින සිට බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.

විමර්ශනයට භාජනය වූ වසර තුළදී පහත සඳහන් මහ බැංකු නිලධාරීන් රජය හා රාජ්‍ය සංස්ථාවලට මුද හැර තිබුණි.

එම්. ආර්. ද සොයිසා, පී. සී. මුණසිංහ, සහ එච්. එම්. බී. ඇල්ලෙපොල යන මහතුන් මුදල් අමාත්‍යාංශයට.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහතා විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයට

ආචාර්ය එස්. බී. ද සිල්වා මහතා කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු පර්යේෂණ අමාත්‍යාංශයට.

එම්. එම්. සෙනෙවිරත්න, ඩී. ආර්. සිරිවර්ධන, ආචාර්ය එන්. රාමචන්ද්‍රන්, ආචාර්ය උස්වත්ත ආරච්චි, එන්. එම්. කප්පාගොඩ, එස්. එම්. පී. සූරියආරච්චි සහ පී. එම්. හසන් යන මහතුන් ක්‍රම සම්පාදක හා රැකීරක්ෂා අමාත්‍යාංශයට.

ඒ. එස්. ජයවර්ධන මහතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට.

පී. එම්. සිරිවර්ධන මහතා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට.

පී. බී. කරඳවල මහතා නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයට.